# වික්ටෝරියාව තුළ පොදු ප්‍රවාහනය භාවිතා කරන්නේ කෙසේද



Transport Victoria

# නොමිලේ ප්‍රවාහනය

මෙල්බර්න්හි නගර මධ්‍යය තුළ ට්‍රෑම් රථවල ගමන් කිරීම සඳහා ගාස්තු අය නොකෙරේ. ඔබ ගාස්තු අය නොකරන ට්‍රෑම් රථ කලාපයේ (Free Tram Zone) පමණක් ගමන් කරන්නේ නම්, ඔබට කාඩ්පත සක්‍රීය කිරීමට හෝ අක්‍රීය කිරීමට අවශ්‍ය නොවේ.

දිනපතා පෙ.ව 9.30 සිට ප.ව 5 දක්වා, ඓතිහාසික City Circle Tram (නගර කවය ඔස්සේ ධාවනය වන ට්‍රෑම් රථය) (ගමන් මාර්ග 35) තුළ නොමිලේ ගමන් කර මෙල්බර්න් ගැන ඉගෙන ගන්න.




## වැදගත් සලකුණු

- ගාස්තු අය නොකරන ට්‍රෑම් රථ කලාපයේ සීමාව
- ගාස්තු අය නොකරන ට්‍රෑම් රථ කලාපයේ නැවතුම්පොළ
- 86 ට්‍රෑම් රථ ගමන් මාර්ගය
- 35 City Circle Tram ගමන් මාර්ගය
- City Circle Tram නැවතුම්පොළ
- ආගන්තුකයන් සඳහා තොරතුරු මධ්‍යස්ථානය
- නගරය තුළ ධාවනය වන දුම්රිය
- ප්‍රාදේශීය දුම්රිය
- ප්‍රාදේශීය දුර ගමන් බස් රථ
- SkyBus ගුවන් තොටුපළ සේවාව
- ඔරුව

ඔබ මායිම් තුළ සිටින බව සහතික කර ගැනීම සඳහා ට්‍රෑම් රථ නැවතුම්පොළවල ඇති මෙම සලකුණු ගැන විමසිලිමත් වන්න.

FREE TRAM ZONE

# ප්‍රවාහනය සඳහා myki භාවිතා කිරීම

myki යනු වික්ටෝරියාවේ පොදු ප්‍රවාහන සේවයේ ගමන් කිරීම සඳහා ඔබේ ටිකට් පතයි.

myki වර්ග දෙකක් තිබේ - ද්‍රව්‍යමය කාඩ්පතක් සහ ඩිජිටල් කාඩ්පතක්.

ඔබ ඔබේ කාඩ්පත ලබා ගත් පසු, ඔබට ගමන් කිරීමට මුදල් එකතු කිරීමට (අවශ්‍ය මුදල් ප්‍රමාණය දැමීමට) අවශ්‍ය වනු ඇත.

## ද්‍රව්‍යමය කාඩ්පතක් මිලදී ගැනීම?

සම්පූර්ණ ගාස්තු කාඩ්පතක් ඩොලර් 6 ක් වේ.

සහන ගාස්තු කාඩ්පතක් ඩොලර් 3 ක් වේ.

යෞවන myki කාඩ්පතක් ඩොලර් 5 ක් වේ.

ඔබට කාඩ්පතක් මාර්ගගතව හෝ යම් ස්ථානයක දී මිලදී ගත හැකිය




## Android උපාංගයක් තිබේන්නේද?

ජංගම myki කඩ්පත ඔබේ Google Wallet මත නොමිලේ සම්පූර්ණ ගාස්තුවක් හෝ සහන ඩිජිටල් කාඩ්පතක් එක් කිරීමට ඉඩ සලසයි.

ඔබේ ස්මාර්ට් ජංගම දුරකථනයේ Google Wallet යෙදුම හරහා ඔබේ myki කඩ්පතට අවශ්‍ය මුදල් ප්‍රමාණය දමන්න. එය මාර්ගගතව කිරීමට මිනිත්තු 45ක් දක්වා ගතවිය හැකිය.




වැඩිදුර දැන ගැනීමට ස්කෑන් කරන්න, නතහොත් **transport.vic.gov.au** වෙත පිවිසෙන්න

# ද්‍රව්‍යමය myki කාඩ්පතක් මිලදී ගෙන අවශ්‍ය මුදල් ප්‍රමාණය දැමිය හක්කේ කොතැනින්ද?

| | මිලදී ගන්න | අවශ්‍ය මුදල් ප්‍රමාණය දමන්න |
|---|---|---|
| වෙබ් අඩවියෙන් | ✓ | ✓ † |
| PTV යෙදුමෙන් | ✗ | ✓ |
| 7-Elevens වෙළඳසැල් සහ myki සලකුණ ප්‍රදර්ශනය කරන වෙනත් වෙළඳසැල් වෙතින් | ✓ | ✓ |
| myki ටිකට් යන්ත්‍ර මගින් | ✓ ## | ✓ |
| myki කඩ්පතට ක්ෂණිකව අවශ්‍ය මුදල් ප්‍රමාණය දැමිය හකි ටිකට් යන්ත්‍ර මගින් | ✗ | ✓ |
| දුම්රිය ස්ථානවල ඇති ටිකට් කාර්යාල වලින් | ✓ | ✓ |
| Southern Cross දුම්රිය ස්ථානයේ PTV මධ්‍යස්ථානයෙන් | ✓ | ✓ |
| දුරකථනය ඔස්සේ | ✓ | ✓ |

† විනාඩි 45ක කාලයක් ලබා දෙන්න.
## ටිකට් යන්ත්‍ර හරහා යෞවන myki කාඩ්පත් මිලදී ගැනීම සිදු කළ නොහැක.

## myki Money හෝ myki Pass තෝරා ගන්න

myki Money මගින් ඔබට ගමන් කරන අවස්ථාවේදී මුදල් ගෙවීමට ඉඩ සලසයි. ඔබ සතියකට දින 5ක් හෝ ඊට වැඩි කාලයක් ගමන් කරන්නේ නම්, myki Pass මඟින් ඔබට මුදල් ඉතිරි කරගත හැකිය.

## ගාස්තු

ඔබ මෙල්බර්න්හි හෝ ප්‍රාදේශීය වික්ටෝරියාවේ  දුම්රියෙන්, ට්‍රෑම් රථයකින් හෝ බස් රථයකින්* ගමන් කරන ඕනෑම තැනකට, උපරිම දෛනික ගාස්තුවට වඩා වැඩි මුදලක් ගෙවීමට ඔබට සිදු නොවනු ඇත.

| **දෛනික උපරිමය** | **සතියේ දිනවල** | **සති අන්තයේ#** |
|---|---|---|
| **සම්පූර්ණ ගාස්තුව** | $11.40 | $8.00 |
| **සහන ගාස්තුව** | $5.70 | $4.00 |

ඔබ ගාස්තු අය නොකරන ට්‍රෑම් රථ කලාපය තුළ පමණක් ගමන් කරන අවස්ථා හැර, සෑම ගමනක් ආරම්භයේදීම කාඩ්පත සක්‍රීය කරන්න.

දුම්රිය, බස් රථ සහ කලාප 2 ට්‍රෑම් රථ චාරිකා සඳහා අඩුම ගාස්තුව ලබා ගැනීමට, ඔබ කාඩ්පත සක්‍රීය කළ යුතුය.

| | **කාඩ්පත සක්‍රීය කරන්න** | **කාඩ්පත අක්‍රීය කරන්න** |
|---|---|---|
| **දුම්රිය** | ✓ | ✓ |
| **බස් රථ** | ✓ | ✓ |
| **1 වැනි කලාපයේ ට්‍රෑම් රථ ගමන්** | ✓ | ✗ |
| **2 වැනි කලාපයේ ට්‍රෑම් රථ ගමන්** | ✓ | ✓ |
| **මෙල්බර්න්හි ගාස්තු අය නොකරන ට්‍රෑම් රථ කලාපය තුළ ට්‍රෑම් රථ ගමන්** | ✗ | ✗ |


### නොමිලේ ප්‍රවාහනය

වයස අවුරුදු 18 ට අඩු සියලුම මගීන් පොදු ප්‍රවාහන සේවය ඔස්සේ ඕනෑම වේලාවක, ඕනෑම තැනක නොමිලේ ගමන් කරයි. යොවුන් වයස අවුරුදු 5 ත් 17 ත් අතර ඕනෑම කෙනෙකුට myki කාඩ්පත ලබාගත හැකිය. අවුරුදු 5 ට අඩු දරුවන් නොමිලේ ගමන් කරන අතර ඔවුන්ට myki කාඩ්පතක් අවශ්‍ය නොවේ.

වික්ටෝරියානු වැඩිමහලු පුද්ගලයන්ට, ඔවුන්ගේ වත්මන් සහන ප්‍රතිලාභ හරහා ලබා ගත හැකි වට්ටම් වලට අමතරව, සති අන්තවල දී ප්‍රාන්තය පුරා නොමිලේ ගමන් කිරීමේ භුක්ති විඳිය හැකිය.

ආබාධිත සහාය විශ්‍රාම වැටුප් ලබන්නන්ට සහ ඔවුන්ව රැකබලා ගන්නන්ට ප්‍රාන්තය පුරා සති අන්තවල නොමිලේ ගමන් කළ හැකිය.

## PTV යෙදුම




PTV යෙදුම මගින් ඔබට
පහත දේ කළ හැකිය:

- අවශ්‍ය මුදල් ප්‍රමාණය ඔබේ myki කාඩ්පතට ක්ෂණිකව දැමීම
- පහසුව සඳහා ස්වයංක්‍රීයව අවශ්‍ය මුදල් ප්‍රමාණය දැමීම සකස් කර එය අමතක කර දැමීම
- ඔබේ කාඩ්පත නැති වුවහොත් ඔබේ ශේෂය ආරක්ෂා කර ගැනීමට ඔබේ myki ලියාපදිංචි කිරීම
- ඔබේ ගමන සැලසුම් කර නිරීක්ෂණය කිරීම.

---

App Store හෝ Google Play වෙතින් නොමිලේ බාගත කරගන්න, නැතහොත් වැඩි විස්තර දැන ගැනීමට **transport.vic.gov.au/app** වෙත පිවිසෙන්න.

## ප්‍රාදේශීය ප්‍රවාහනය

දෛනික ගාස්තු සීමාව සමඟින්, ඔබට වික්ටෝරියාවේ ඕනෑම දුම්රියකින්, බස් රථයකින් හෝ ප්‍රාදේශීය දුර ගමන් බස් රථයකින් දවස පුරා ඩොලර් 11.40 වැනි සිලු මුදලකට ගමන් කළ හැකිය - සති අන්තවල ගස්තුව ඊටත් වඩා අඩුය.

බැලරට්, බෙන්ඩිගෝ, ජිලොන්ග්, ගිප්ස්ලෑන්ඩ් සහ සේමූර් ඇතුළු ප්‍රාදේශීය වික්ටෝරියාවේ බොහෝ ප්‍රදේශවලට ගමන් කිරීමට myki ඔබේ ටිකට් පත ලෙස භාවිතා කෙරේ.

**මට වෙනස් වර්ගයේ ටිකට්පතක් අවශ්‍ය වන්නේ කවර විටකද?**

myki කලාපවලින් පිටත සිදු කරන ගමන් සඳහා eTicket හෝ කඩදාසි ටිකට්පතක් අවශ්‍ය වේ.

* **SkyBus ගුවන් තොටුපළ සේවාව සහ වික්ටෝරියාවට පිටතින් ආරම්භ වන හෝ අවසන් වන ගමන් මෙයින් බැහැර කරයි.**

\# **සති අන්ත සහ රජයේ නිවාඩු දින.**

වැඩිදුර තොරතුරු

**transport.vic.gov.au**

ඔබට ශ්‍රවණාබාධ හෝ කථන ආබාධ තිබේ නම්, National Relay Service (ජාතික රිලේ සේවාව) හරහා අප අමතන්න - වැඩිදුර තොරතුරු සඳහා **relayservice.gov.au** වෙත පිවිසෙන්න

තොරතුරු වෙනත් භාෂාවලින් ලබා ගැනීම සඳහා:

| | | | |
|---|---|---|---|
| 普通話 | 9321 5454 | 廣東話 | 9321 5441 |
| **Italiano** | 9321 5444 | ਪੰਜਾਬੀ | 9321 5445 |
| **Ελληνικά** | 9321 5443 | हिन्दी | 9321 5442 |
| **Việt-ngữ** | 9321 5449 | සිංහල | 9321 5446 |
| عربي | 9321 5440 | **Español** | 9321 5447 |

ඔබගේ භාෂාව ලැයිස්තුගත කර නොමැති නම්,
**transport.vic.gov.au/languages**
වෙත පිවිසෙන්න, නැතහොත් 9321 5450 අමතන්න.

2026 ජනවාරි 1 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

DTP1681-E/25

VICTORIA State Government
Department of Transport and Planning
PT>